7 මූල්‍ය අවශ්‍යතා සහ ආයෝජන මාර්ග

මෙම පරිච්ඡේදය මගින් පහත දැක්වෙන තේමා පිළිබඳ ව සාකච්ඡා කෙරේ.

7.1 ව්‍යාපාරවල මූල්‍ය අවශ්‍යතා

7.2 මූල්‍ය සම්පාදන මාර්ග

7.3 මූල්‍ය සම්පාදන මාර්ග ඇගයීම

7.4 මුල්‍ය සම්පාදන මාර්ග තෝරා ගැනීම

7.5 ආයෝජන මාර්ග ඇගයීම

7.6 විවිධ ආයෝජන මාර්ගවල ප්‍රතිලාභ

7.7 ආයෝජන මාර්ග තෝරා ගැනීමේ දී සලකා බලන කරුණු

නොමිලේ බෙදහැරීම සඳහා ය.

ප්‍රාග්ධන වෙළෙඳපොළ විමර්ශනය කරමින් යෝග්‍ය තීරණවලට එළඹෙමු.

පහත දැක්වෙන රූපවාහිනී වැඩ සටහන කෙරෙහි ඔබගේ අවධානය යොමු කරන්න.

අද ඔබට "හසිනි, දිලිනි" සමඟ වැඩ සටහන තුළින් මුණ ගැසෙන්නේ ප්‍රධාන පෙළේ සමාගමක මුදල් කළමනාකරු වන "භානු මුතුකුමාරණ මහතා"යි.

හසිනි ආයුබෝවන් භානු මහත්මයා

භානු ආයුබෝවන්

දිලිනි මේ සාකච්ඡාවට සහභාගී වීම වෙනුවෙන් ස්තුති කරන අතර මගේ පළමුවෙනි ප්‍රශ්නය ඔබ තුමාට යොමු කරනවා. මුදල් කළමනාකරණ කටයුතු පිළිබඳ ව මූලික අත්දැකීම් නිවස තුළින් ම දකින්න පුළුවන් නේ ද ?

භානු ඔව් ඇත්තෙන් ම, ව්‍යාපාරයක වුවත් නිවසක වුවත් සිදු වන්නේ විවිධ මාර්ගවලින් මුදල් සම්පාදනය කර ගැනීම සහ විවිධ කටයුතු වෙනුවෙන් එම මුදල් යෙදවීම තමයි.

හසිනි ඒ කරුණ තව දුරටත් අපට පැහැදිලි කළොත් ?

භානු පුද්ගලයන් තම මූල්‍ය අවශ්‍යතා සපුරා ගන්නා විවිධ මාර්ග තිබෙනවා. රැකියාවෙන් හා දේපලවලින් ආදායම් ලබා ගන්න පුළුවන්. පුද්ගලික ණය ලබා ගැනීමත් සිදු කරනවා. ඒ වගේ ම තවත් අය තමන් සතු ගොඩනැගිලි වැනි වත්කම් කුලියට දී ආදායම් ලබා ගන්නවා.

හසිනි එතකොට හැම කෙනෙක් ම මුදල් යොදවන්නේ එකම දේට නොවෙයි නේද?

භානු හැම දෙනා ම මුදල් යොදවන්නේ එකම දේට නොවුනත් වියදම් කිරීමේ සමාන ස්වරූපයක් දකින්න පුළුවන්.

දිලිනි වියදම් කිරීම සමාන වන්නේ කොහොම ද ?

භානු අපට පුළුවන් පුද්ගලයෙක් මුදල් යොදවන අවස්ථා දෙකක් හඳුනා ගන්න. ඉන් එකක් තමයි එදිනෙදා කටයුතුවලට මුදල් යෙදවීම. ඒ කියන්නේ සහල්, එළවළු, සබන්, බෙහෙත් වැනි දේවල් නිරන්තරයෙන් මිල දී ගැනීමේ අවශ්‍යතාව.

හසිනි එතකොට අනෙක් අවශ්‍යතාව ?

භානු සමහර දේවල් අපි ලබා ගන්නේ දිගු කාලීනව ප්‍රයෝජනයට ගන්න. ශීතකරණ, රූපවාහිනී ,රෙදි සෝදන යන්ත්‍ර වගේ දේවල් නිතර නිතර මිලට ගන්නේ නැහැ නේ ද ? ඒ වාගේ දේවල් අපි ගන්නේ දිගු කාලීන ප්‍රයෝජනයට.

මෙම සාකච්ඡාව මගින් පුද්ගලයන්ගේ මුදල් අවශ්‍යතා මෙන් ම මුදල් සම්පාදන මාර්ග පිළිබඳ ව ද අවබෝධයක් ලැබෙනු ඇත. පුද්ගලයන්ට මෙන් ම ව්‍යාපාරවලට ද විවිධ මූල්‍ය අවශ්‍යතා ඇති වන බවත් ඒ සඳහා විවිධ අන්දමින් මුදල් සම්පාදනය කර ගත හැකි බවත් මෙම පරිච්ඡේදය කියවීමෙන් ඔබට පැහැදිලි වනු ඇත.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

හැඳින්වීම

සෑම පුද්ගලයකුට ම සිය දිවි පෙවෙත පවත්වා ගෙන යාම සඳහා විවිධ ආකාරයේ භාණ්ඩ හා සේවා ලබා ගැනීමට මුදල් අවශ්‍ය වේ. මේ සඳහා නොයෙක් ආකාරයෙන් මුදල් සම්පාදනය කර ගනී. ව්‍යාපාර ද විවිධ අයුරින් සම්පාදනය කර ගන්නා මුදල් ව්‍යාපාර කටයුතු සඳහා යොදවයි. මෙසේ තමන් සතු මුදල් ව්‍යාපාර කටයුතුවල යෙදවීමට අමතරව වෙනත් විකල්ප මාර්ගවල ආයෝජනය කිරීමට ද යොමු වේ. විවිධ ප්‍රතිලාභ අපේක්ෂාවෙන් සිදු කෙරෙන මෙවැනි ආයෝජන නිසා ආයෝජකයන්ට මෙන් ම සමාජයට ද ප්‍රතිලාභ අත්වේ. ව්‍යාපාරයක මුදල් සම්පාදනය, මුදල් යෙදවීම සහ ආර්ථිකයක විකල්ප ආයෝජන මාර්ග පිළිබඳව මෙම පරිච්ඡේදය තුළින් සාකච්ඡා කෙරේ.

මෙම පරිච්ඡේදයේ දී පහත සඳහන් මූලික යෙදුම් පිළිබඳව ඔබගේ අවධානය යොමු කෙරේ.

- දිගු කාලීන මූල්‍ය අවශ්‍යතා
- කෙටි කාලීන මූල්‍ය අවශ්‍යතා
- සාමාන්‍ය කොටස්
- වරණීය කොටස්
- විධිමත් ආයෝජන
- ඉතුරුම් තැන්පත්
- ස්ථාවර තැන්පත්
- කොටස් වෙළෙඳ පොළ
- ප්‍රාග්ධන ලාභ
- ප්‍රසාද කොටස්
- හිමිකම් නිකුතුව
- ප්‍රතිලාභ සහ අවදානම

7.1 ව්‍යාපාරවල මූල්‍ය අවශ්‍යතා

වර්තමානයේ මිනිස් වුවමනාවන් වඩාත් සංකීර්ණ වෙමින් පවතී. මෙවැනි පසුබිමක් තුළ වෙළෙඳපොල තත්ත්වයන් හොඳින් අධ්‍යයනය කිරීමෙන් සුදුසු ව්‍යාපාර අවස්ථා හඳුනාගෙන ඒ සඳහා යොමු වීම හොඳ ජීවනෝපාය මාර්ගයක් වශයෙන් ද වැදගත් වනු ඇත. ව්‍යාපාර කටයුතුවල දී මුදල් සම්පාදනය කර ගැනීමත් එම මුදල් ඵලදයී ලෙස ආයෝජනය කිරීමත් කෙරෙහි සැලකිලිමත් වීම අවශ්‍ය වේ. අපි පළමුව ව්‍යාපාරවලට ඇති වන මූල්‍ය අවශ්‍යතා කිහිපයක් සොයා බලමු.

1. ව්‍යාපාරයක ආරම්භක කටයුතු සඳහා

ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දී වත්කම් මිලට ගැනීමටත් එම අවස්ථාවේ දී ඇති වන විවිධ වියදම් පියවා ගැනීමටත් මුදල් අවශ්‍ය වේ.

2. ව්‍යාපාර පුළුල් කිරීමේ කටයුතු සඳහා

මින් අදහස් කරන්නේ ව්‍යාපාරයට අලුත් අංශයක් එකතු කිරීම හෝ ශාඛා ආරම්භ කිරීම වැනි ව්‍යාපාරය පුළුල් කිරීමේ කටයුතු සඳහා අවශ්‍ය වන මුදල් ය. එවිට අලුතින් උපකරණ, ගොඩනැගිලි, රථ වාහන යනාදී වත්කම් සම්පාදනය කර ගැනීමට අවශ්‍ය වේ.

3. වෙනත් ව්‍යාපාරයක් අත්පත් කර ගැනීම හෝ මිල දී ගැනීම සඳහා

ව්‍යාපාරයක් පවත්වා ගෙන යන අතරතුර දී වෙනත් පාර්ශ්වයක් විසින් පවත්වා ගෙන යන ව්‍යාපාර අත්පත් කර ගැනීමට ද අවස්ථා උදා වනු ඇත. මේ සඳහා මුදල් අවශ්‍ය වේ. නිදසුනක් වශයෙන් ලී බඩු සාප්පුවක් පවත්වා ගෙන ගිය ව්‍යාපාරයක් විසින් වෙනත් අයෙකුගේ වඩු කර්මාන්ත ශාලාවක් අත්පත් කර ගැනීම දැක්විය හැකි ය.

ඉහත දැක්වෙන ප්‍රධානතම අවශ්‍යතාවලට අමතරව,

- එදිනෙදා ව්‍යාපාර කටයුතු මැනවින් පවත්වා ගෙන යාම සඳහා

  නිදසුන්
  - තොග මිලට ගැනීම
  - විවිධ වියදම් සඳහා ගෙවීම.

- අනපේක්ෂිත සිදුවීම්වලට මුහුණ දීම සඳහා

  නිදසුන්
  - අනපේක්ෂිත ලෙස ඇණවුම් ලැබීම.
  - ණය ගැතියන්ගෙන් මුදල් නොලැබී යාම.

යනාදී වශයෙන් ව්‍යාපාරවලට මූල්‍ය අවශ්‍යතා පැන නඟිනු ඇත. ඕනෑම ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වා ගෙන යාමේ දී විවිධ ආකාරයේ මූල්‍ය අවශ්‍යතා ඇති වන බව පෙනී යයි. වෙනත් ආකාරයකින් පැවසුවහොත් ව්‍යාපාර කටයුතු වෙනුවෙන් ආයෝජනය කළ යුතු බව පැහැදිලි ය. මේ අනුව ව්‍යාපාරයකට ඇති වන මූල්‍ය අවශ්‍යතා, කාලය ප්‍රධාන කොට ගෙන කරුණු දෙකක් යටතේ සලකා බැලිය හැකි ය.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

1. දිගුකල් ආයෝජන සඳහා මූල්‍ය අවශ්‍යතා

ව්‍යාපාර කටයුතු සඳහා අවශ්‍ය වන ඉඩම් සහ ගොඩනැගිලි අත්පත් කර ගැනීම, ඉදි කිරීමේ කටයුතු, යන්ත්‍ර උපකරණ මිල දී ගැනීම යනාදිය සඳහා මුදල් යෙදවීමට සිදු වනු ඇත. මෙවැනි අවස්ථා දිගු කාලීන මූල්‍ය ආයෝජන අවශ්‍යතා වශයෙන් සැලකේ.

2. කෙටි කාලීන ආයෝජන සඳහා මූල්‍ය අවශ්‍යතා

එදිනෙද කටයුතු පවත්වා ගෙන යාම සඳහා වන මූල්‍ය අවශ්‍යතා මින් අදහස් කෙරේ. මේ අනුව වැටුප්, රක්ෂණ, වරිපනම්, ප්‍රවාහන ගාස්තු, විදුලිය, බදු ගෙවීම සහ වෙළෙඳ ණය යනාදිය ගෙවීමට ද , ව්‍යාපාර කටයුතු සඳහා තොග පවත්වා ගෙන යාමට ද මුදල් යෙදවිය යුතු ය. මේවා කෙටිකාලීන මූල්‍ය ආයෝජන අවශ්‍යතා වශයෙන් සලකනු ලැබේ.

ඉහත දක්වෙන මූල්‍ය අවශ්‍යතා වෙනුවෙන් යොදවන මුදල් ප්‍රමාණ ව්‍යාපාර කටයුතුවල ස්වභාවය අනුව වෙනස් වන බව ද සැලකිල්ලට ගත යුතු ය.

නිදසුන

- එළවළු වෙළෙඳ සලක් සඳහා කෙටි කාලීන ආයෝජන අවශ්‍යතා වැඩි වීමට පුළුවන.
- ගොඩනැගිලි ඉදි කිරීමේ ආයතනයකට දිගු කලීන ආයෝජන අවශ්‍යතාව සඳහා විශාල මුදලක් යෙදවීමට සිදුවිය හැකි ය.

7.2 මූල්‍ය සම්පාදන මාර්ග

ව්‍යාපාරයකට විවිධ මූල්‍ය අවශ්‍යතා ඇති බවත් ඒ සඳහා මුදල් ආයෝජනය කළ යුතු බවත් ඔබට පැහැදිලි ඇතැයි සිතමි. දැන් අප සලකා බලනුයේ ඒ සඳහා මුදල් සම්පාදනය කර ගන්නා ආකාරයන් පිළිබඳව ය.

මෙහි දී,

- දිගු කාලීන ආයෝජන අවශ්‍යතා සඳහා දිගු කාලීන මූල්‍ය සම්පාදන මාර්ග
- කෙටි කාලීන ආයෝජන අවශ්‍යතා සඳහා කෙටි කාලීන මූල්‍ය සම්පාදන මාර්ග

යොදවා ගැනීම සුදුසු වේ. මේ අනුව ව්‍යාපාරික කටයුතු සඳහා මුදල් ආයෝජනය කිරීමත් එම මුදල් සම්පාදනය කර ගැනීමත් අතර සම්බන්ධතාවයක් ඇති බව ඔබට පැහැදිලිවනු ඇත.

ව්‍යාපාර සංවිධාන ක්‍රමය අනුව මූල්‍ය සම්පාදන මාර්ග හඳුනා ගනිමු

ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාම සඳහා විවිධ ආකාරයේ සංවිධාන බිහි වී ඇති බව ඔබ දන්නා කරුණකි. පෞද්ගලික අංශය මෙන් ම පොදු අංශය ද ව්‍යාපාර කටයුතුවල නිරත වේ. ඇතැම් ව්‍යාපාර සංවිධාන සඳහා මූල්‍ය සම්පාදන මාර්ග බහුල ව ඇති අතර ඇතැම් ව්‍යාපාර සංවිධාන සඳහා මූල්‍ය සම්පාදන මාර්ග සීමිත වේ. මූල්‍ය සම්පාදන මාර්ග බහුල වීම ව්‍යාපාර කටයුතුවල සංවර්ධනයට රුකුලක් වන අතර මූල්‍ය මාර්ග සීමිත වීම ව්‍යාපාර වැඩි දියුණු කිරීමට බාධාවක් වේ.

නොමිලේ බෙදහැරීම සඳහා ය.

තනි පුද්ගල ව්‍යාපාර

අයිතිකරුගේ ඉතිරි කිරීම්, පවුලේ ඥාතීන්ගෙන් සහ හිතවත් අයගෙන් ලබා ගන්නා මුදල් ප්‍රධානතම මූල්‍ය සම්පාදන මාර්ග වේ. සමීප සම්බන්ධකම් මත ලබා ගන්නා මුදල් බොහෝ විට පොලී රහිතව ලබා ගනී. එමෙන් ම පෞද්ගලික ණය සහ බැංකු හා මූල්‍ය සමාගම් වැනි ආයතනික ණය ආදිය ලබා ගැනීම මගින් මූල්‍ය සම්පාදනය කර ගැනීම සිදු වේ.

හවුල් ව්‍යාපාර

මෙම ව්‍යාපාරවල ප්‍රධානතම මූල්‍ය සම්පාදන මාර්ගය වනුයේ හවුල් කරුවන් විසින් සිදු කරනු ලබන ප්‍රාග්ධන සම්පාදනයයි. හවුල් කරුවන්ගේ එකඟතාව මත මෙම මුදල් ව්‍යාපාරයට යොදවනු ලැබේ. මෙසේ ප්‍රාග්ධනය ලෙස මුදල් යෙදවීමට අමතර ව හවුල් කරුවන් ව්‍යාපාරයට ණය සපයන අවස්ථා ද ඇත. මීට අමතර ව පෞද්ගලික ණය සහ බැංකු හා වෙනත් මූල්‍ය සමාගම් වැනි ආයතනවලින් ලබා ගන්නා ණය ආදිය ද හවුල් ව්‍යාපාරයක මූල්‍ය සම්පාදනයට දායක වේ.

මේ අනුව තනි පුද්ගල ව්‍යාපාරවලට සාපේක්ෂව හවුල් ව්‍යාපාරවලට මූල්‍ය සම්පාදනය කර ගැනීමේ හැකියාව වැඩි බව ඔබ අවබෝධ කර ගෙන ඇත. මෙය හවුල් ව්‍යාපාර වර්ධනය සඳහා වාසිදායක කරුණක් ලෙසට බලපානු ඇත.

සීමාසහිත සමාගම් (සංස්ථාපිත සමාගම්)

මෙම ව්‍යාපාර සංවිධාන සඳහා අනෙකුත් ව්‍යාපාර සංවිධානවලට සාපේක්ෂව මූල්‍ය සම්පාදන මාර්ග බහුලව පවතී. එනම්,

- කොටස් නිකුත් කිරීම
- ණයකර නිකුත් කිරීම
- උකස් කර
- බැංකු ණය
- බැංකු නොවන ආයතනික ණය
- කල් බදු, යනාදිය ඉන් කිහිපයකි.

සමූපකාර ව්‍යාපාර

මෙම ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ ප්‍රධානතම මූල්‍ය සම්පාදන මාර්ගය වන්නේ සාමාජිකයන්ගෙන් රැස් කර ගනු ලබන සාමාජික මුදල් ය. ඊට අමතර ව බැංකු සහ වෙනත් ආයතනික ණය, රජයේ මූල්‍ය ආධාර යනා දී ආකාරයන්ගෙන් මූල්‍ය සම්පාදනය සිදු කෙරේ.

පොදු අංශයේ ව්‍යාපාර

රජය, පළාත් සභා, පළාත් පාලන ආයතන විසින් පවත්වා ගෙන යන ව්‍යාපාර කටයුතු පොදු අංශයේ ව්‍යාපාර වශයෙන් සලකනු ලැබේ. මෙම ව්‍යාපාර සඳහා ප්‍රධානතම මූල්‍ය සම්පාදන මාර්ගය වනුයේ රජය මගින් සපයන මුදල් ය. මීට අමතර ව ඇතැම් රාජ්‍ය ආයතන ප්‍රසිද්ධියේ කොටස් නිකුත් කිරීමෙන් ද මුදල් සම්පාදනය කර ගනී.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ක්‍රියාකාරකම 01

ඔබ ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කළේ යැයි සිතන්න. මෙම ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා,

1. ඔබට අවශ්‍ය වන සම්පත් කවරේ දැයි දක්වන්න.
2. එම සම්පත් සඳහා මූල්‍ය සම්පාදනය කර ගන්නා ආකාරය පැහැදිලි කරන්න.

7.3 මූල්‍ය සම්පාදන මාර්ග ඇගයීම

විවිධ ව්‍යාපාර සංවිධාන විසින් තම ව්‍යාපාරික කටයුතු සඳහා අවශ්‍ය මුදල් සම්පාදනය කර ගන්නා ආකාරය ඉහතින් සඳහන් කරන ලදී. දැන් අපි එම එක් එක් මූල්‍ය මාර්ග අගයමු.

බැංකු ණය

බැංකු ණය ඕනෑම ආයෝජනයකට අවශ්‍ය මුදල් සම්පාදනය කර ගත හැකි විධිමත් මාර්ගයක් වශයෙන් සැලකිය හැකි ය. බැංකු විසින් අපේක්ෂා කරන අවශ්‍යතා සපුරාලිය හැකි ව්‍යාපාරවලට බැංකු ණය පහසුකම් සැලසේ. සාමාන්‍යයෙන් අනෙකුත් ණය සම්පාදන මාර්ගවලට වඩා අඩු පොලියකට ණය සැපයීම සිදු කෙරේ. එමෙන් ම ව්‍යාපාර කටයුත්තේ ස්වභාවය අනුව පොලිය වෙනස් වන අවස්ථා ද ඇත. හිතකර ව්‍යාපාර කටයුතු වර්ධනය කිරීමේ අරමුණ ඇති නිසා ලිහිල් කොන්දේසි යටතේ ණය සැපයීම සිදු කරයි. මේ නිසා බැංකු ණය පහසුකම් සලසා ගැනීම වඩා සුදුසු මූල්‍ය සම්පාදන මාර්ගයකි.

වත්කම් විකිණීම/කුලියට දීම/උකස් කිරීම

ව්‍යාපාරයක් සතුව පවත්නා වත්කම් භාවිත කරමින් අවශ්‍ය මුදල් සපයා ගත හැකි බව මින් අදහස් කරයි. ඇතැම් විට ව්‍යාපාර සතු අතිරික්ත වත්කම් එනම් භාවිතයට නොගැනෙන වත්කම් තිබිය හැකි ය. මේවා විකිණීමෙන් හෝ කුලියට දීමෙන් හෝ උකසට තබා ණය ගැනීමෙන් හෝ මූල්‍ය සම්පාදනය කර ගැනීමට පුළුවන. මෙම මූල්‍ය සම්පාදන මාර්ගයේ වාසියක් වනුයේ ඉතා ඉක්මනින් මුදල් ලබා ගත හැකි වීමයි. එමෙන් ම භාවිතයට නොගන්නා වත්කමක් යොදා ගනිමින් මුදල් සම්පාදනය කර ගැනීම ඵලදායක වූවකි.

පෞද්ගලික ණය

බොහෝ සුළු පරිමාණ ව්‍යාපාරිකයින් මූල්‍ය සම්පාදනය සඳහා යොමු වන අවිධිමත් මාර්ගයක් වශයෙන් මෙය හඳුනා ගැනීමට පුළුවන. ඉහළ පොලියට ණය පහසුකම් සලසන නමුත් ඉතා ඉක්මණින් ණය ලබා ගත හැකි වීමත් බොහෝ විට ඇප අවශ්‍ය නොවීමත් පෞද්ගලික ණය ලබා ගැනීමේ වාසිදායක තත්ත්වයන් වශයෙන් සැලකිය හැකි ය.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

කොටස් නිකුත් කිරීම

සීමාසහිත සමාගම් විසින් ප්‍රාග්ධනය සපයා ගැනීම සඳහා කොටස් නිකුත් කරනු ලැබේ. මෙහි දී සිදු වන්නේ ව්‍යාපාරික ප්‍රාග්ධනය කොටස්වලට බෙද එම කොටස්වල අයිතිය කොටස් මිලට ගන්නා අයට ලබා දී සමාගමට අවශ්‍ය මුදල් සම්පාදනය කර ගැනීම ය. සාමාන්‍ය කොටස් සහ වරණීය කොටස් වශයෙන් ප්‍රධාන වර්ග දෙකක් දක්නට ලැබේ.

සාමාන්‍ය කොටස්

නිශ්චිත ලාභාංශ ප්‍රතිශතයක් ගෙවීමේ එකඟතාවකින් තොරව නිකුත් කරන කොටස් වර්ගයකි. වාර්ෂික මෙහෙයුම් ලාභය මත ලාභාංශ ප්‍රතිශතය තීරණය කෙරේ. මෙමගින් රැස් කර ගන්නා මුදල් ව්‍යාපාරය අවසානය දක්වා ම රඳවා ගත හැකි ය.

වරණීය කොටස්

නිශ්චිත ලාභාංශ ප්‍රතිශතයක් ලැබීමට හිමිකම් සහිත ව නිකුත් කෙරෙන කොටස් වර්ගයකි.

මූල්‍ය සම්පාදන මාර්ගයක් වශයෙන් සාමාන්‍ය කොටස් නිකුත් කිරීම මගින් ව්‍යාපාරයකට සැලසෙන ප්‍රයෝජන කිහිපයක් පහත සඳහන් වේ.

* **මුදල් වැඩි ප්‍රමාණයක් රැස් කර ගත හැකි වීම.**

  සීමාසහිත පොදු සමාගම්වලට ප්‍රසිද්ධියේ මහජනතාවට කොටස් නිකුත් කිරීමට හැකියාව ඇත. එමගින් මුදල් වැඩි ප්‍රමාණයක් සම්පාදනය කර ගැනීමට පුළුවන.

* **සම්පාදනය කර ගත් මුදල් ව්‍යාපාරයේ අවසානය දක්වා ම රඳවා ගත හැකිවීම.**

  මේ නිසා මුදල් බේරුම් කිරීමේ අවදානමක් නොමැත. සපයා ගත් මුදල් ව්‍යාපාරය තිබෙන තෙක් ව්‍යාපාර කටයුතු සඳහා යොද ගත හැකි ය.

* **පොලී ගෙවීමට සිදු නොවීම.**

  සාමාන්‍ය කොටස් සඳහා පොලී වියදමක් දැරීමට සිදු නොවේ. ලාභාංශ ගෙවීම ද සිදු වන්නේ මෙහෙයුම් ලාභය මත ය. එම නිසා සම්පාදනය කර ගත් මුදල් වෙනුවෙන් අනිවාර්ය වියදමක් දැරීමට සිදු නොවේ.

* **ව්‍යාපාරය පිළිබඳ විනිවිද භාවයක් පැවතීම.**

  කොටස් මිල දී ගෙන සමාගමට මුදල් සපයන පාර්ශ්වයන්ට සමාගමේ මූල්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම නෛතික අවශ්‍යතාවයකි. මෙසේ ව්‍යාපාරික තොරතුරු හෙළිදරව් කිරීමට සිදු වන නිසා ව්‍යාපාරය පිළිබඳ මහජනතාව දැනුවත් වීම ආයතනය ලබන ප්‍රයෝජනයක් වශයෙන් සඳහන් කළ හැකි ය.

මෙසේ විවිධ මූල්‍ය සම්පාදන මාර්ග පිළිබඳ ව ඇගයීම තුළින් තම ව්‍යාපාර සංවිධාන ක්‍රමයට සහ තමන්ගේ ව්‍යාපාර කටයුත්තට සුදුසුතම මූල්‍ය සම්පාදන මාර්ගය තෝරා ගැනීම පිළිබඳ ව නිගමනයට එළඹීමට හැකි වේ.

නොමිලේ බෙදහැරීම සඳහා ය.

7.4 මූල්‍ය සම්පාදන මාර්ග තෝරා ගැනීම

ව්‍යාපාර කටයුතුවල දී විවිධ අවශ්‍යතා වෙනුවෙන් මුදල් ආයෝජනය කිරීමට සිදු වේ. මේ සඳහා විවිධ ආකාරයේ මූල්‍ය සම්පාදන මාර්ග ද පවතී. එසේ වුවත් වඩාත් ප්‍රතිඵලදායක ව්‍යාපාර කටයුත්තක් සිදු කිරීම සඳහා සුදුසුතම ආකාරයෙන් මුදල් සම්පාදනය කර ගැනීම අවශ්‍ය වනු ඇත. එම නිසා මෙහි දී අවධානය යොමු කළ යුතු කරුණු කිහිපයක් පිළිබඳ ව සලකා බලමු.

- ❋ අවශ්‍යතාවයේ ස්වභාවය
- ❋ සුරැකුම් අවශ්‍යතා
- ❋ මූල්‍ය සැපයීම සම්බන්ධ කොන්දේසි
- ❋ ලබා ගැනීමේ පහසුව
- ❋ බේරුම් කිරීමේ හැකියාව
- ❋ පිරිවැය
- ❋ ව්‍යාපාර සංවිධානයේ ස්වාභාවය
- ❋ ආපසු ගෙවීමට ලබා දෙන කාලය
- ❋ ව්‍යාපාර කටයුතුවල ස්වභාවය

ඉහත දැක්වූ එක් එක් කරුණු පිළිබඳ විස්තර පහත සඳහන් වේ.

1. අවශ්‍යතාවයේ ස්වභාවය

කුමන කරුණක් සඳහා මුදල් අවශ්‍ය වේ ද යන්න සොයා බැලිය යුතු ය.

නිදසුන
- ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා නම් දිගු කාලීන මූල්‍ය සම්පාදන මාර්ගයක් තෝරා ගත යුතු ය.
- විකිණීම පිණිස වෙළෙඳ ද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා අවශ්‍ය වන්නේ නම් කෙටි කාලීන මූල්‍ය සම්පාදන මාර්ගයක් තෝරා ගැනීම අවශ්‍ය වේ.

මෙහි දී අවශ්‍යතාව දිගු කාලීන ද කෙටි කාලීන ද වශයෙන් සැලකිලිමත් වීම වැදගත් වේ.

2. සුරැකුම් අවශ්‍යතා

බැංකු වැනි ආයතනික මාර්ගවලින් ණය සම්පාදනය කර ගැනීමේ දී ඇප සුරැකුම් ඉදිරිපත් කිරීමට සිදු වේ. වැඩි වශයෙන් ම ඇප සුරැකුම් ලෙස ඉල්ලා සිටින්නේ ඉඩම්, ගොඩනැගිලි වැනි ස්ථාවර වත්කම් ය. මේවා ඉදිරිපත් කිරීමේ හැකියාව මත ණය ලබා ගැනීම ද තීරණය කෙරේ.

3. මූල්‍ය සැපයීම සම්බන්ධ කොන්දේසි

විවිධ ආයතනවලින් මූල්‍ය සම්පාදනය කර ගැනීමේ දී එම ආයතනය ඉදිරිපත් කරන විවිධ කොන්දේසිවලට අනුව කටයුතු කිරීමට සිදුවේ.නිදසුනක් වශයෙන් කිසියම් ව්‍යාපාරික දේපළක් ඇපයට තබා ලබා ගත් ණය මුදල් බේරුම් කිරීමට නොහැකි වුව හොත් එම දේපළ භාවිතයට ගැනීම තහනම් කිරීම සම්බන්ධයෙන් ගැටලුවකට මුහුණ දීමට සිදු වනු ඇත. එමෙන් ම ණය වාරික ගෙවීම ප්‍රමාද වීම වෙනුවෙන් අය කරනු ලබන දඩ පොලී පිළිබඳ ව ද සැලකිලිමත් විය යුතු ය.

4. ලබා ගැනීමේ පහසුව

මින් අදහස් කරන්නේ අවශ්‍ය මුදල් පහසුවෙන් ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳ ව ය. ඇතැම් අවස්ථාවල ලිපි ලේඛන රාශියක් භාවිතා කරමින්, පුද්ගලයන් කිහිප දෙනෙක් සම්බන්ධ වෙමින්, කාල පමාවකින් ද යුක්ත ව මුදල් සම්පාදනය කර ගැනීමට සිදු වන බව පෙනේ.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

5. බේරුම් කිරීමේ හැකියාව

මුදල් සම්පාදනයේ දී ව්‍යාපාරයේ පවතින තත්ත්වය පිළිබඳ ව අවබෝධයකින් සිටීම අවශ්‍ය වේ. එනම් සම්පාදනය කර ගත් මුදල් යෙදවීමෙන් ලැබෙන ආදායම්වලින් ණය වාරික හා පොලී ගෙවීම, ආදිය කළ හැකි ද යන්න සැලකිය යුතු ය. නැතහොත් සමස්ත ව්‍යාපාරය ම අපහසුතාවට පත් විය හැකි ය.

6. පිරිවැය

මූල්‍ය සම්පාදනය ආරම්භක අවස්ථාවේ දී මෙන් ම අදාළ මුදල නැවත පියවන තෙක් පිරිවැයක් දැරීමට සිදු වේ. බැංකු ණයක් ලබා ගැනීම, කොටස් නිකුත් කිරීම යනාදී සම්පාදන මාර්ග සඳහා ලිපි ලේඛන කටයුතු, ප්‍රචාරණ කටයුතු, නීතිඥ ගාස්තු, මුද්දර ගාස්තු යනාදිය වෙනුවෙන් පිරිවැයක් දැරීමට සිදුවේ. එමෙන් ම අදාළ කාලය සඳහා ණය වෙනුවෙන් පොලී ද කොටස් වෙනුවෙන් ලාභාංශ ද ගෙවීමට සිදු වනු ඇත. එම නිසා මූල්‍ය මාර්ගයේ පිරිවැය එම මුදල ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ සමග ගළපමින් තීරණ ගත යුතුව ඇත.

7. ව්‍යාපාර සංවිධානයේ ස්වභාවය

සෑම ව්‍යාපාර සංවිධානයකට ම සෑම ආකාරයකින් ම මුදල් සම්පාදන කර ගත නොහැකි ය. නිදසුනක් වශයෙන් තනි පුද්ගල හා හවුල් ව්‍යාපාරවලට කොටස් නිකුත් කිරීමෙන් මුදල් සම්පාදනය කර ගත නොහැකි ය. එබැවින් ව්‍යාපාර හැම විට ම නීත්‍යානුකූල ව ලබා ගත හැකි මූල්‍ය සම්පාදන මාර්ගවලට යොමු විය යුතු ය.

8. ආපසු ගෙවීමට ලබා දෙන කාලය

ඇතැම් මූල්‍ය සම්පාදනයන් ඉතා ඉක්මණින් එනම් වසරකට වඩා අඩු කාලයක් තුළ බේරුම් කිරීමට සිදු වන අතර ඇතැම් විට ඊට වඩා වැඩි කාලයක් තුළ බේරුම් කිරීමට අවස්ථාව ලැබේ. ණය මුදලක් නම් කාලය කෙටි වන විට වැඩි වාරිකයක් ගෙවීමට සිදු වේ. එවිට ව්‍යාපාරයේ ආදායමින් වැඩි මුදලක් ණය වාරික ගෙවීමට සිදු වීම නිසා ව්‍යාපාරයේ පැවැත්මටත් ප්‍රසාරණයටත් බාධකයක් විය හැකි ය. කාලය දිගු වූයේ නම් මෙවැනි අපහසුතා මග හැරෙනු ඇත.

9. ව්‍යාපාර කටයුතුවල ස්වභාවය

ව්‍යාපාර කටයුතුවල ස්වභාවය ගැන සලකමින් මූල්‍ය සම්පාදන මාර්ගයක් කෙරේ අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. එනම් කුඩා සිල්ලර වෙළෙඳ සලක් ආරම්භ කරන අයකුට වඩා ඇඟලුම් කම්හලක් ආරම්භ කිරීමට අදහස් කරන අයෙකු ප්‍රයෝජනයට ගත යුතු මූල්‍ය සම්පාදන මාර්ග වෙනස් විය හැකි ය.

මේ අයුරින් එක් එක් මූල්‍ය සම්පාදන මාර්ගය පිළිබඳ ව අධ්‍යයනය කර තම ව්‍යාපාර සංවිධාන ක්‍රමය අනුව, තම ව්‍යාපාරයේ ස්වභාවය අනුව, වඩාත් සුදුසුතම මූල්‍ය සම්පාදන මාර්ගය තෝරා ගැනීම තුළින් ව්‍යාපාරයේ සාර්ථකත්වය සලසා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

ක්‍රියාකාරකම් 02

"සීමා සහිත සමාගම්වල මූල්‍ය සම්පාදන මාර්ග අනෙකුත් ව්‍යාපාර සංවිධානවලට වඩා බහුල වේ." ඔබගේ අදහස් දක්වන්න.

ක්‍රියාකාරම් 03

"සීමිත සමාගම් කොටස් නිකුත් කිරීම මගින් මූල්‍ය සම්පාදනය කර ගැනීමට වැඩි කැමැත්තක් දක්වයි."
මෙම ප්‍රකාශය සම්බන්ධ ව ඔබගේ අදහස් ඉදිරිපත් කරන්න.

ක්‍රියාකාරම් 04

"මූල්‍ය සම්පාදන මාර්ගයක් තෝරා ගැනීමේ දී සැලකිය යුතු කරුණු " යන මැයෙන් ඔබේ පාසලේ වාණිජ විද්‍යා සඟරාවට ලිපියක් සකස් කරන්න.

7.5 ආයෝජන මාර්ග ඇගයීම

වර්තමාන ව්‍යාපාරික පරිසරය ඉතා සීඝ්‍රයෙන් වෙනස්කම්වලට භාජනය වෙමින් පවතී. එම වෙනස්වීම් සමග මුදල් ආයෝජනය කිරීමේ අවස්ථා ද පුළුල් වී ඇත. ආයෝජනය යනු පුද්ගලයන් හා ආයතන විසින් තමා සතු අතිරික්ත මුදල් ආදායම් ලැබිය හැකි මාර්ගයක යෙදවීම ලෙස සරල ව හැඳින්විය හැකි ය. ව්‍යාපාරික ආයෝජනය පිළිබඳව අපි මෙම පරිච්ඡේදය ආරම්භයේ දී සාකච්ඡා කළෙමු. මෙහි දී අවධානය යොමු කරනු ලබන්නේ වෙනත් ආයෝජන මාර්ග පිළිබඳ ව ය.

පුද්ගලයන්ට හා ආයතනවලට තමා සතු මුදල් රඳවා තැබිය හැකි කාලය අනුව ආයෝජන මාර්ග තෝරා ගැනීමට ඔවුනට හැකියාව තිබේ. ඒ අනුව මෙම ආයෝජන මාර්ග වර්ග දෙකකට වෙන් කළ හැකි ය.

- ❋ කෙටි කාලීන ආයෝජන මාර්ග
- ❋ දිගු කාලීන ආයෝජන මාර්ග

නොමිලේ බෙදහැරීම සඳහා ය.

කෙටි කාලීන ආයෝජන මාර්ග වශයෙන් සාමාන්‍යයෙන් පිළිගැනෙන්නේ වසරකට වඩා අඩු කාලයකට අදාළ වන ආයෝජනයන් ය. වසරකට වඩා වැඩි කාලයක් යොදවන ආයෝජන දිගු කාලීන ආයෝජන ලෙස හැඳින්වේ. මේ කුමන මාර්ගයක වුව ද කෙරෙන ආයෝජන ඒවායේ නෛතික ස්වභාවය පදනම් කොට ගෙන ප්‍රධාන වර්ග දෙකකට බෙදා විස්තර කළ හැකි ය.

- විධිමත් ආයෝජන මාර්ග
- අවිධිමත් ආයෝජන මාර්ග

මෙහි දී විශේෂයෙන් ම අප අවධානය යොමු කරනු ලබන්නේ විධිමත් ආයෝජන මාර්ග කෙරෙහි ය. එහෙත් අවිධිමත් ආයෝජන මාර්ග එතරම් ප්‍රචලිත නොවන බව මින් අදහස් නොකෙරේ. පැහැදිලි නෛතික පදනමකින් තොරව සංවිධානාත්මක ස්වරූපයෙන් සිදු නොකෙරෙන ආයෝජන අවිධිමත් ආයෝජන මාර්ග ලෙස හඳුනාගත හැකි ය. සීට්ටු දැමීම, මුදල් ණයට දීම යනාදිය අවිධිමත් ආයෝජන මාර්ග ලෙස හඳුනාගත හැකි ය. ආයෝජිත මුදලේ අනාරක්ෂිත භාවය හා නීතිමය ආවරණ ලැබීමට නොහැකි වීම යන අයහපත් ලක්ෂණ නිසා එම මාර්ගවල ආයෝජනය කිරීම පිළිබඳ ව දෙවරක් සිතා බැලිය යුතු ය.

විධිමත් ආයෝජන මාර්ග යනු පැහැදිලි නෛතික පදනමකින් යුතුව සංවිධානාත්මක ස්වරූපයෙන් සිදු වන ආයෝජනයන් වේ. අද බොහෝ පාර්ශවයන් විධිමත් මාර්ගවල තම මුදල් ආයෝජනය කිරීමට පෙළඹී ඇත. එවැනි තත්ත්වයක් ඇති වීමට හේතු කිහිපයක් පෙන්නුම් කළ හැකි ය.

- පිළිගත් නීතිමය පසුබිමක් පැවතීම
- ආයෝජනයට ලැබෙන සුරක්ෂිත භාවය
- ආයෝජනය තුළින් ලබන ස්ථිර ප්‍රතිලාභ
- මූල්‍ය නොවන වෙනත් ප්‍රතිලාභ ලැබීම

Baras, Rizal
3000sqm Lot For Sale
Online
Cash
Management
WE SHIP SEAFOOD ANYWHERE
FRESH ALASKAN SPOT SHRIMP

විවිධ ආයෝජන මාර්ග

අපි දැන් විධිමත් ආයෝජන මාර්ග කිහිපයක් කෙරෙහි අවධානය යොමු කරමු.

- ❋ තැන්පතු ආරම්භ කිරීම
- ❋ වත්කම් මිලට ගැනීම
- ❋ කොටස් මිල දී ගැනීම

තැන්පතු ආරම්භ කිරීම

බැංකුවල හා වෙනත් මූල්‍ය ආයතනවල විවිධ ගිණුම් යටතේ මුදල් ආයෝජනය කළ හැකි ය. මෙය බොහෝ අය අතර ජනප්‍රිය ආයෝජන මාර්ගයකි. බැංකු හා මූල්‍ය ආයතන ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීම පිණිස විවිධ තැත්පතු වර්ග හඳුන්වා දී ඇත. මෙවැනි තැන්පතු වර්ග කිහිපයක් පිළිබඳ ව අධ්‍යයනය කරමු.

1. ඉතුරුම් තැන්පතු
2. කාලීන තැන්පතු (ස්ථාවර තැන්පතු)
3. තැන්පතු සහතික

ඉතුරුම් තැන්පතු

පොලී ආදයම් අපේක්ෂාවෙන්, සුළු මුදලක් වුව ද තැන්පත් කළ හැකි, අවශ්‍ය විටක මුදල් ආපසු ලබා ගැනීමට ඉඩ සලසන ආකාරයේ තැන්පතු විශේෂයකි. ඉතුරුම් තැන්පතු ඕනෑම ආයෝජකයෙකුට ඉතාම සමීප ආයෝජන මාර්ගයක් ලෙස දැක්විය හැකි ය. එයට හේතු කිහිපයකි.

- ❋ ආරම්භ කිරීම පහසු වීම.
- ❋ අවශ්‍ය විටක දී ඉතා සුළු මුදලක් වුව ද තැන්පත් කළ හැකි වීම.
- ❋ මුදල් ආයෝජනය කිරීම සඳහා ස්ථානීය පහසුකම් සලසා තිබීම.

නිදසුන්

- ⊙ තැපැල් කාර්යාල
- ⊙ පාසල් සමූපකාර හා පාසල් බැංකු
- ⊙ සමූපකාර ග්‍රාමීය බැංකු
- ⊙ වාණිජ බැංකු
- ⊙ බැංකු නොවන වෙනත් මූල්‍ය ආයතන

- ❋ තැන්පතුවේ ඇති මුදල් අවශ්‍ය විටක ඉතා පහසුවෙන් නැවත ලබා ගත හැකි වීම.

ස්ථාවර තැන්පතු (කාලීන තැන්පතු)

නිශ්චිත මුදලක් නිශ්චිත කාලයකට නිශ්චිත පොලී ප්‍රතිශතයක් මත පවත්වා ගෙන යන තැන්පතු මේ නමින් හඳුන්වයි. කල්පිරෙන දිනට පෙර මෙම තැන්පතුවල මුදල් ආපසු ලබා ගන්නේ නම් ගිවිස ගත් පොලිය නො ලැබේ. තමා කැමති පරිදි පොලිය මාසිකව හෝ ත්‍රෛමාසිකව හෝ කල් පිරුණු පසුව හෝ යනාදී වශයෙන් ලබා ගැනීමට පුළුවන. සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුම්වලට වඩා පොලී ප්‍රතිශතය වැඩි වන අතර තැන්පතුවේ කාල සීමාව අනුව ද පොලී ප්‍රතිශතය වෙනස් වේ.

ස්ථාවර තැන්පතුවක මුදල් ආයෝජනයෙන් පහත දැක්වෙන ප්‍රයෝජන ලබා ගත හැකිය.

- ❋ ගිවිසගත් කාලය අවසානයේ දී නිශ්චිත මුදලක් හිමි වීම.
- ❋ ඉතුරුම් තැන්පතුවලට වඩා ඉහළ පොලියක් හිමි වීම.
- ❋ තැන්පතු කාලය වැඩි නම් වැඩි පොලී ප්‍රතිශතයක් හිමි වීම.

තැන්පතු සහතික

එකවර නිශ්චිත මුදල් ප්‍රමාණයක් නිශ්චිත කාල සීමාවකට බැංකුවක හෝ මූල්‍ය ආයතනයක හෝ ආයෝජනය කිරීමේ මාර්ගයක් වශයෙන් තැන්පතු සහතික හැඳින්විය හැකි ය. මේ සඳහා සාමාන්‍ය ඉතුරුම්වලට වඩා වැඩි පොලී ප්‍රතිශතයක් ලැබේ. සාමාන්‍යයෙන් වර්ෂයක කාලයක් සඳහා නිකුත් කරනු ලැබේ. බොහෝ විට මෙම තැන්පතු සහතික සඳහා විශේෂ ත්‍යාග, ලොතරැයි දිනුම් ඇදීම් මගින් පිරිනමනු ලැබේ.



ක්‍රියාකාරකම 05

1. ඔබේ පාසලේ/ප්‍රදේශයේ බැංකුවක කටයුතු නිරීක්ෂණය කොට පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු ඔබේ මිතුරා /මිතුරිය සමග සාකච්ඡා කරන්න.

   i. එහි ආරම්භ කළ හැකි තැන්පතු වර්ග කවරේ ද ?
   ii. එම බැංකුවෙහි තැන්පතු ආරම්භ කිරීමට අවශ්‍ය වන අවම මුදල කොපමණ ද?
   iii. විවිධ තැන්පතුවලට ලබා දෙන පොලී ප්‍රතිශතයන් කොපමණ ද?
   iv. එම මුදල් තැන්පත් කිරීමේ ක්‍රියා පිළිවෙළ දක්වන්න.
   v. සිසුන් විසින් තැන්පත් කරනු ලබන මුදල් ආපසු ලබා ගත හැක්කේ කෙසේ ද?
   vi. තැන්පත් මුදල් වැඩි වීමත් සමග ලැබෙන අමතර ප්‍රතිලාභ කවරේ ද ?

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

වත්කම් අත්පත් කර ගැනීම

වර්තමානයේ දී බොහෝ පාර්ශ්වයන් ආයෝජන මාර්ගයක් වශයෙන් වත්කම් මිලට ගැනීමේ කාර්යයේ නිරතවනු දක්නට ලැබේ. වර්තමානයේ මුදලේ අගය පහළ බැසීමේ ප්‍රවණතාවක් දක්නට ලැබෙන බැවින් ඇතැමුන් මෙසේ ආයෝජන මාර්ගයක් වශයෙන් වත්කම් මිලට ගැනීමට පෙළඹී ඇති බව පෙනේ.

මේ අයුරින් අත්පත් කරගනු ලබන වත්කම්

- නිශ්චල වත්කම්
- චංචල වත්කම් වශයෙන් හඳුනා ගැනීමට පුළුවන.

නිශ්චල වත්කම්වල ආයෝජනය

නිශ්චල දේපළ වශයෙන් හඳුන්වන්නේ එහි අයිතිකරුවන්ට එහා මෙහා ගෙන යා නොහැකි තත්ත්වයක පවතින වත්කම් වේ. ආයෝජන මාර්ගයක් වශයෙන් වර්තමානයේ බොහෝ ආයෝජකයෝ නිශ්චල දේපළ මිලට ගැනීම සිදු කරති. විශේෂයෙන්ම ඉඩම් මිලට ගැනීම බහුලව දක්නට ලැබෙන දෙයකි. රටක පවත්නා ඉඩම් ප්‍රමාණය සීමිත බැවින් හා ඒවායේ ඵලදායී ජීව කාලය සීමා රහිත බැවින් ඉඩම්වල මිල ඉහළ යාමක් දක්නට ලැබේ. එම නිසා මේවායේ මුදල් ආයෝජනය තුළින් ඉහළ ප්‍රාග්ධන ලාභ ඉපයීමට හැකි වනු ඇත.

මීට අමතර ව දේපළ වශයෙන් ගොඩනැගිලි මිලට ගැනීම් සඳහා මුදල් ආයෝජනය කරනු දක්නට ලැබේ.

චංචල වත්කම්වල ආයෝජනය

වර්තමානයේ දී ආයෝජන මාර්ගයක් වශයෙන් බොහෝ පාර්ශ්වයන් යොදා ගන්නා තවත් විකල්පයක් ලෙස චංචල දේපළ මිලට ගැනීම හඳුනාගත හැකි ය. චංචල වත්කම් යනු වෙනත් නිශ්චල වත්කමකට හෝ දේපළකට ස්ථාවරව සවිකර නොමැති එහා මෙහා ගෙන යා හැකි වත්කම් වේ. මෙහි දී විශේෂයෙන්ම ස්වර්ණාභරණ මිලට ගැනීම බහුල ව දක්නට ලැබේ. මීට අමතර ව දියමන්ති, මැණික් වැනි වටිනා සම්පත් අත්පත් කර ගැනීම පෞරාණික කෞතුක වස්තු අත්පත් කර ගැනීම ද සඳහන් කළ හැකි ය. මේවා අතුරෙන් ස්වර්ණාභරණවල ආයෝජනය කිරීමට වැඩි දෙනෙක් පෙළඹී සිටිනු දක්නට ලැබේ. මේ සඳහා බලපාන හේතු කිහිපයක් හඳුනාගත හැකි ය.

- නිරන්තරයෙන් ම විවෘත වෙළෙඳ පොළේ මිල ගණන් ඉහළ යාමේ ප්‍රවණතාවක් පැවතීම.
- ඉක්මණින් මුදල් බවට පත් කර ගත හැකි වීම.

මෙවැනි තත්ත්වයක් යටතේ ස්වර්ණාභරණ අත්පත් කර ගැනීම කාලෝචිත ආයෝජන මාර්ගයක් ලෙස සැලකිය හැකි ය.

කොටස් මිලට ගැනීම

සමාගම්වල කොටස් මිලට ගැනීම මුදල් ආයෝජනය කළ හැකි තවත් විධිමත් ආයෝජන මාර්ගයකි. එය සිදු කරනුයේ කොටස් වෙළෙඳ පොළ හරහා ය. මේ මගින් සීමිත සමාගම් කොටස් නිකුත් කරන අවස්ථාවල දී හෝ සමාගම්වලින් කොටස් මිල දී ගෙන ඇති ආයෝජකයන් ඒවා නැවත විකුණන අවස්ථාවල දී හෝ කොටස් මිල දී ගත හැකි වේ.

ශ්‍රී ලංකාවේ කොටස් ගනුදෙනු කිරීම සඳහා කොළඹ කොටස් වෙළෙඳ පොළ පිහිටුවා ඇත. මෙම වෙළෙඳ පොළේ ගනුදෙනු කරනුයේ එහි ලියාපදිංචි සමාගම්වල කොටස් පමණි. කොළඹ කොටස් වෙළෙඳ පොළේ ලියාපදිංචි කළ සමාගම් නිල ලයිස්තුගත සමාගම් ලෙස හැඳින්වේ. **කොටස් වෙළෙඳ පොළේ කටයුතු මෙහෙයවනු ලබන්නේ කොළඹ කොටස් හුවමාරුව (Colombo Stock Exchange) විසිනි. එමෙන්ම ශ්‍රී ලංකා සුරැකුම් පත් හා විනිමය කොමිසන් සභාව විසින් මෙහි කටයුතු අධීක්ෂණය කරනු ලබයි.**

සමාගමක් නිකුත් කරනු ලබන කොටස් වර්ග දෙකකි.

- සාමාන්‍ය කොටස්
- වරණීය කොටස්

ආයෝජන මාර්ගයක් වශයෙන් මෙහි දී වැඩි අවධානය යොමු කරනු ලබන්නේ **සාමාන්‍ය කොටස්** සම්බන්ධයෙනි. එයට හේතුව කොටස් වෙළෙඳ පොළෙහි වැඩි වශයෙන්ම හුවමාරු වන්නේ සාමාන්‍ය කොටස් වීමයි. සීමිත සමාගමක සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය සලකනුයේ අයිතිකරුවන්ගේ ප්‍රාග්ධනය ලෙසිනි.

සාමාන්‍ය කොටස්

සීමිත සමාගම් විසින් බහුල වශයෙන් නිකුත් කරනු ලබන කොටස් විශේෂයක් වශයෙන් සාමාන්‍ය කොටස් හඳුනා ගැනේ. මෙම කොටස්වල පවතින ප්‍රධාන ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

- **ලාභාංශ ගෙවීම**

  සමාගමේ පවතින ලාභය මත ලාභාංශ තීරණය කරනු ලැබේ. සාමාන්‍යයෙන් ලාභ නොමැති අවස්ථාවල දී ලාභාංශ ප්‍රකාශ නොකරන අතර වැඩි ලාභයක් පවතින අවස්ථාවල ඉහළ ලාභාංශයක් ලබා ගැනීමට අවස්ථාව තිබේ.

- **සමාගමේ හිමිකාරත්වය හා පාලන බලතල හිමි වීම**

  සමාගමක් කළමනාකරණය කරනු ලබන්නේ තෝරා ගත් අධ්‍යක්ෂ මණ්ඩලයක් විසිනි. එම අධ්‍යක්ෂ මණ්ඩලය සාමාන්‍ය කොටස් මිල දී ගත් අය අතුරෙන් තෝරා ගනු ලැබේ. ඒ අනුව සාමාන්‍ය කොටස් හිමියන්ට අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්විය හැකි ය.

- **ඡන්ද බලය හිමි වීම**

  සමාගම විසින් පවත්වනු ලබන රැස්වීම්වලට සහභාගී වීමටත් ඉදිරිපත් වන යෝජනා පිළිබඳ මත විමසුම්වල දී ඡන්දය ප්‍රකාශය කිරීමටත් හැකියාව තිබේ.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ආයෝජන කළඹ

ඉහත සඳහන් විධිමත් ආයෝජන මාර්ගවල තනි තනිව අයෝජනය කිරීමට අමතර ව ආයෝජකයින්ට තමන් සතු මුදල් විවිධ ආයෝජන මාර්ගයන්හි යෙදවීමට අවස්ථාව සැලසෙන ආකාරයක් වශයෙන් **ආයෝජන කළඹ** හඳුනා ගැනීමට පුළුවන.

පුද්ගලයන් හා ආයතන සතු මුදල් එකවර විවිධ ආයෝජන මාර්ගවල යෙදවීමට පුළුවන. එනම් බැංකු හා මූල්‍ය සමාගම්වල තැන්පත් කිරීම, සමාගම්වල කොටස් මිලට ගැනීම යනාදි ආයෝජන මාර්ග කිහිපයක් එක වර තෝරා ගත හැකි ය. මෙමගින් ආයෝජනයේ අවදානම අඩු වන අතර ආදයම් ලැබීම පිළිබඳ ව ද අවිනිශ්චිත බව අඩු කර ගැනීමට හැකි වීම වාසියකි.

ඒකක භාර

ඒකක භාර යනු ආයෝජකයන්ට ඒකක විකිණීමෙන් එක් රැස් කර ගන්නා මුදල්වලින් සමන්විත ආයෝජන අරමුදලකි. ඒකක මිලට ගැනීම විවිධ පුද්ගලයන්ට හා ආයතනවලට කළ හැකි වේ. මෙම ඒකකයක අගය ඉතා සුළු බැවින් සුළු මුදලක් ඇති ආයෝජකයන්ට ද ඒකක මිලට ගෙන මෙම අරමුදලට සහභාගි විය හැකි ය.

මෙම අරමුදල කළමනාකරණය කරනුයේ ආයෝජනය පිළිබඳ විශේෂ දක්ෂතා ඇති වෘත්තීය කළමනාකරුවන් විසිනි. ඔවුන් ආයෝජන මාර්ග තීරණ කරන නිසාත් විවිධ වූ ආයෝජන මාර්ගවල එම මුදල් යොදවන නිසාත් වැඩි ප්‍රතිලාභ ලබා ගත හැකි වේ. එමෙන් ම ආයෝජනවල අවදානම අඩු වීම ද මින් ලැබෙන විශේෂ වාසියකි.

මේ අනුව ඒකක භාරවල ඒකක මිලට ගැනීම ද හොඳ ආයෝජන මාර්ගයක් වශයෙන් සඳහන් කිරීමට පුළුවන.

7.6 විවිධ ආයෝජන මාර්ගවල ප්‍රතිලාභ

අප මීට ඉහත දී විවිධ ආයෝජන මාර්ග පිළිබඳ සාකච්ඡා කළ අතර මීළඟට ආයෝජන මාර්ගවලින් ලැබෙන ප්‍රතිලාභ කවරේ දැයි විමසා බලමු.

තැන්පතුවලින් ලැබෙන ප්‍රතිලාභ

ආයෝජකයන්ට තැන්පතුවල මුදල් ආයෝජනය කිරීමේ දී ප්‍රතිලාභ කිහිපයක් ලබා ගත හැකි ය.

- පොලිය යම් ආයෝජකයකු සිය තැන්පතුවලින් ලබන ආදයම පොලිය නමින් හැඳින්වේ. බැංකු සහ වෙනත් මූල්‍ය ආයතන තැන්පතුකරුවන්ගේ ආයෝජන තමන් වෙත ආකර්ෂණය කර ගැනීම පිණිස විවිධ තැන්පත් සඳහා වෙනස් ප්‍රතිශතයන් යටතේ පොලී ගෙවනු ලැබේ.

- සුරක්ෂිත බව තමා ආයෝජනය කළ මුදල නැවත සුරක්ෂිතව ලබා ගත හැකි ද එමෙන්ම ඒවායේ ආදයම් ලබා ගැනීම පිළිබඳ ව අවිනිශ්චිත බවක් නොමැති වීම ද යනාදි කරුණු පිළිබඳ ව පවතින විශ්වාසය යි.

නොමිලේ බෙදහැරීම සඳහා ය.

❋ වෙනත් ප්‍රතිලාභ බැංකු සහ මූල්‍ය ආයතන විසින් සිය ආයතනික තැන්පතු කෙරෙහි ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා විවිධ ප්‍රතිලාභ සලසන බව පෙනේ.

නිදසුන් ◉ ලොතරැයි ඇදීම් වැනි කටයුතු මගින් ත්‍යාග ලැබීම. රක්ෂණාවරණ ලැබීම. ණය ලබා ගැනීමේ දී සුරැකුම් ලෙස ඉදිරිපත් කළ හැකි වීම.

වත්කම් / දේපළ මිලට ගැනීමේ ප්‍රතිලාභ

මෙම ආයෝජන මාර්ගය තුළින් ද ආයෝජකයින්ට අත්වන ප්‍රතිලාභ කිහිපයක් පහත දැක්වේ.

❋ **අත්පත් කර ගත් දේපළ විකිණීමේ දී ප්‍රාග්ධන ලාභ ලැබිය හැකි වීම.**

යම් වත්කමක් අත්පත් කර ගැනීමට යෙදවූ මුදලට වඩා වැඩි මුදලකට විකිණීමෙන් ලබන ලාභය ප්‍රාග්ධන ලාභ නම් වේ.

නිදසුන් ◉ රු. 800,000කට මිලට ගත් ඉඩමක් රු. 850,000කට විකිණීමෙන් රු.50,000ක ප්‍රාග්ධන ලාභයක් ලබා ගත හැකි වීම.

❋ **අත්පත් කරගත් දේපළවලින් ආදායම් ලැබිය හැකි වීම.**

නිදසුන් ◉ නිවසක් සහිත ඉඩමක් මිලට ගැනීමෙන් කුලී ආදායම් ලබා ගත හැකි වීම.

◉ දේපළෙහි පිහිටා ඇති ස්වභාවික සම්පත් (ජලය, ඛණිජ වර්ග, කෘෂි බෝග) වලින් ආදායම් ලැබිය හැකි වීම.

❋ **සුරැකුම් වශයෙන් ඉදිරිපත් කළ හැකි වීම.**

බාහිර ආයතනවලින් ණය මුදල් ලබා ගැනීම සඳහා බොහෝ විට ඇප සුරැකුම් අවශ්‍ය වේ. මෙවැනි විටක දී යම් ආයෝජකයකු අත්පත් කර ගත් දේපළ ඇප සුරැකුම් වශයෙන් ද ඉදිරිපත් කළ හැකි ය.

කොටස්වල ආයෝජනයේ ප්‍රතිලාභ

සීමිත සමාගමක සාමාන්‍ය කොටස්වල මුදල් ආයෝජනය කළ පාර්ශ්වයන්ට විවිධ ප්‍රතිලාභ භුක්ති විඳිය හැකි ය.

❋ **ලාභාංශ**

සමාගම උපයන ශුද්ධ ආදායමෙන් කොටස් හිමියන්ට බෙදා හරින ප්‍රමාණය ලාභාංශ වශයෙන් හැඳින්වේ. මූල්‍ය වර්ෂයක් අවසානයේ ලාභාංශ ප්‍රකාශයට පත් කරනු ලැබේ. සමහර සමාගම් ඊට අමතරව වර්ෂය තුළ දී ද ලාභාංශ ප්‍රමාණයක් ගෙවීම සිදු කෙරේ. මේවා අතුරු ලාභාංශ යනුවෙන් හැඳින්වේ. සමාගම වැඩි ලාභයක් ඉපයූ අවස්ථාවල දී මෙම කොටස් හිමියන්ට වැඩි ලාභාංශ ප්‍රමාණයක් හිමි විය හැකි ය.

❋ **ප්‍රාග්ධන ලාභ**

කොටස් මිල දී ගත් ආයෝජකයින් ඒවා ගත් මිලට වඩා වැඩි මිලකට විකුණන විට ඔහුට ලැබෙන වාසිය ප්‍රාග්ධන ලාභ වශයෙන් හැඳින්වේ.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

නිදසුන් කිසියම් ආයෝජකයකු සමාගමක කොටස් 800ක් රු. 12 බැගින් මිලට ගෙන රු. 16 බැගින් විකුණුවේ නම් ඔහුට ලැබෙන ප්‍රාග්ධන ලාභය (16 12 X 800) රු. 3,200කි.

❋ ප්‍රසාද කොටස් සඳහා හිමිකම

සාමාන්‍ය කොටස් මිල දී ගත් ආයෝජකයන්ට මිල දී ගෙන ඇති කොටස් මත මිලක් අය නොකර යම් අනුපාතයකට අනුව ලබා දෙන කොටස් ප්‍රසාද කොටස් ලෙස සැලකේ. මේ අනුව සාමාන්‍ය කොටස් හිමියන් මුදලින් දයක නොවූව ද හිමිවන සියලුම කොටස් මත හිමිකම් ලබා ගනී.

❋ හිමිකම් නිකුතුව (අයිතිවාසිකම් නිකුතුව)

සමාගමක් කොටස් නිකුත් කරන අවස්ථාවක දී දැනට සමාගමේ කොටස් මිල දී ගෙන සිටින ආයෝජකයනට කිසියම් අනුපාතයක් අනුව තීරණය කරන ලද මිලකට කොටස් ලබා දීම හිමිකම් නිකුතුව ලෙස දැක්විය හැකි ය. මෙවැනි අවස්ථාවල දී ලබන වාසිය වනුයේ කොටස් වෙළෙඳපොලේ පවතින මිලට වඩා අඩු මිලකට කොටස් මිලට ගැනීමට අවස්ථාව ලැබීම ය.

❋ කොටස් වෙනත් අයෙකුට පවරා මුදල් බවට පත් කර ගැනීමේ හැකියාව.

යම් ආයෝජකයකු මිල දී ගත් සාමාන්‍ය කොටස් තමාට මුදල් අවශ්‍ය වූ විටක දී පවරා මුදල් බවට පත් කර ගැනීමේ හැකියාව තිබේ.

❋ සුරැකුම් ලෙස ඉදිරිපත් කළ හැකි වීම.

බාහිර ආයතනවලින් ණය ලබා ගැනීමේ දී සාමාන්‍ය කොටස්වල ආයෝජනය කිරීම වෙනුවෙන් ලද කොටස් සහතික පත් ඇප සුරැකුම් ලෙස ඉදිරිපත් කළ හැකි ය.

❋ වෙනත් ප්‍රතිලාභ

ඉහත දැක් වූ ප්‍රතිලාභවලට අතිරේක ව සාමාන්‍ය කොටස් හිමියන් ලබන වෙනත් ප්‍රතිලාභ ද තිබේ.

නිදසුන්
- අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීමේ හැකියාව ලැබීම.
- ව්‍යාපාරික තීරණ ගනු ලබන අවස්ථාවල දී අදහස් ඉදිරිපත් කිරීමට හැකි වීම.
- භාණ්ඩ හා සේවා මිල දී ගැනීමේ දී එම ආයතනයේ කොටස් හිමියකු නම් විශේෂ සහන ලබා ගැනීමේ හැකියාව (වට්ටම්)

7.7 ආයෝජන මාර්ග තෝරා ගැනීමේ දී සලකා බලන කරුණු

යම් ආයෝජකයකු තම මුදල් ආයෝජනය කිරීමේ දී කරුණු කිහිපයක් අවධානයට යොමු කරනු ඇත. මෙහි දී ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ සහ එමගින් ඇති විය හැකි අවදානම පිළිබඳ විශේෂයෙන් සැලකිලිමත් විය යුතු වේ.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ප්‍රතිලාභ

මින් අදහස් කරනු ලබන්නේ ආයෝජකයා විසින් ආයෝජනය කරන ලද සම්පත් උදෙසා මූල්‍යමය හෝ මූල්‍යමය නොවන අයුරින් ලැබෙන වාසි සමූහයි. සෑම පුද්ගලයකු ම තම මුදල් ආයෝජනය කරනුයේ ප්‍රතිලාභයක් අපේක්ෂාවෙනි. යම් ආයෝජනයක් සඳහා ලැබෙන ප්‍රතිලාභය පිළිබඳ ව සෑහීමකට පත් විය නොහැකි නම් තම මුදල් වෙනත් ආයෝජන මාර්ගයක යෙදවීම පිළිබඳ ව සලකා බලනු ඇත.

අවදානම

ආයෝජනය කරනු ලැබූ සම්පත් නැවත ලබා ගැනීමට ආයෝජකයාට අයිතියක් තිබේ. සමහර අවස්ථාවල දී ඒවා නැවත ලබා ගැනීම පිළිබඳ ව විවිධ ප්‍රායෝගික ගැටලු පැන නැගිය හැකි ය. එසේ නම් ඉන් පැහැදිලි වන්නේ ඊට අදළ ව අවදනමක් පවතින බවයි.

එමෙන් ම තමා ආයෝජනය කරන මුදලට නියමිත ආදයම් ලබා ගැනීම පිළිබඳ අවිනිශ්චිත භාවයක් ඇති නොවිය යුතු ය. එනම්, අදළ ආදයම් ගිවිස ගත් ආකාරයට නියමිත ප්‍රමාණයෙන් නියමිත කාලය තුළ ලැබිය යුතු ය. එසේ නොවන්නේ නම් පෙන්නුම් කරනුයේ ඒ පිළිබඳ අවදනමක් පවතින බව ය.

ආයෝජනයක ප්‍රතිලාභ සහ අවදනම අතර සම්බන්ධතාව පහත දක්වෙන අයුරින් පෙන්නුම් කළ හැකි ය.

ප්‍රතිලාභ	අවදනම
ඉහළය	ඉහළය
පහළය	පහළය

මේ වගුව අනුව ඔබට පැහැදිලි වන්නේ ප්‍රතිලාභ ඉහළ ආයෝජන මාර්ගයක ඉහළ අවදනමක් පවතින බව ය. එමෙන් ම අවදනම පහළ මට්ටමක පවතින ආයෝජනයක ප්‍රතිලාභ ද පහළ මට්ටමක පවතින බව ය.

මේ කරුණු අනුව ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ සහ එහි ඇති අවදනම පිළිබඳ ව සැලකිලිමත් වෙමින් සුදුසුතම ආයෝජන මාර්ගයක් තෝරා ගත යුතු ය. එසේ වුව ද ආයෝජන තීරණ පුද්ගල ආකල්ප අනුව විවිධ විය හැකි ය.
එයට හේතු වන්නේ,

- ආයෝජන පිළිබඳ පුද්ගලයන් සතු දනුම.
- අවදනම් දරීමට පුද්ගලයන් තුළ ඇති කැමැත්ත
- පුද්ගල අපේක්ෂා
- ආර්ථික, සමාජීය, දේශපාලන තත්ත්වයන්
- ව්‍යවසායකත්ව කුසලතා වැනි කරුණු ද ආයෝජන තීරණ කෙරෙහි බලපාන බැවිනි.

නොමිලේ බෙදහැරීම සඳහා ය.

මුදල් ආයෝජනය පිළිබඳ තීරණ බොහෝ කරුණු සලකා බලා කළ යුතු බව ඔබ අවබෝධ කර ගෙන ඇත. තීරණ ගත යුත්තේ ඉතා ඥානාන්විත ව හා බුද්ධිමත් ව සිතීමෙනි. එවිට සියලු කටයුතු සාර්ථකව ඉටු කර ගත හැකි ය.

ක්‍රියාකාරකම් 06

“ඉහළ ප්‍රතිලාභ අපේක්ෂාවෙන් අවිධිමත් මාර්ගයක මුදල් ආයෝජනය කිරීම අවදානම් සහිතය.” යන මාතෘකාව යටතේ ලිපියක් සකස් කොට පාසලේ උදෑසන රැස්වීමේ දී ඉදිරිපත් කරන්න.

ක්‍රියාකාරකම් 07

“ආයෝජන කළඹ” ආයෝජකයන්ගේ අවදනම අඩු කිරීමටත් ප්‍රතිලාභ වැඩි කිරීමටත් හේතු විය හැකි ය. මෙම කරුණ පිළිබඳ ව ඔබගේ මිතුරන් සමග සාකච්ඡා කරන්න.

ක්‍රියාකාරකම් 08

“ආයෝජන පුළුල් කිරීම මගින් ආර්ථික සංවර්ධනය වේගවත් කළ හැකි ය.” මෙම ප්‍රකාශයට පක්ෂව කරුණු ඉදිරිපත් කරන්න.

ක්‍රියාකාරකම් 09

වර්තමාන ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන කෙටි කාලීන හා දිගු කාලීන ආයෝජන මාර්ග පිළිබඳ ව ඔබේ ගුරුතුමා සමග සාකච්ඡා කොට නිර්මාණාත්මක වාර්තාවක් පිළියෙල කරන්න. එම වාර්තාව පාසලේ බිත්ති පුවත් පතෙහි ප්‍රදර්ශනය කරන්න.